Worked

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,922/1 — 1970 සැප්තැම්බර් 5 වැනි සෙනසුරාද — 1970.9.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 281/1**

අ.ආ.කා. අංක : සී. 162/49(8).

1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරතුමා පහත සඳහන් පත්වීම කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ :—

| | |
|---|---|
| (1) ආගමන හා විගමන පාලක සහ ඉන්දියානු හා පකිස්තානු පදිංචිකරුවන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්, ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. ටී. ජයසිංහ මහතා | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ඒ. ආර්. රත්නවේල් මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු තම රාජකාරි වලට අමතරව, 1970 සැප්තැම්බර 4 වැනි දින සිට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ධුරයෙහි වැඩ බැලීමට. |
| (2) ක්‍රම සම්පාදන හා රැකිරක්ෂා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් මහාචාර්ය එම්. ඒ. ද ඇස්. ගුණසේකර මහතා | විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ආචාර්ය ජේ. බී. කැලේගම මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ, තම රාජකාරිවලට අමතරව 1970 සැප්තැම්බර 4 වැනි දින සිට 15 වැනි දින දක්වා, විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ධුරයෙහි වැඩ බැලීමට. |
| (3) ආහාර කොමසාරිස්, ලංකා පරිපාලන සේවයේ බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න මහතා | විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ආචාර්ය ජේ. බී. කැලේගම මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු තම රාජකාරිවලට අමතරව 1970 සැප්තැම්බර 16 වැනි දින සිට විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ධුරයෙහි වැඩ බැලීමට. |

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 5 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී ය.

9–526

---

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඔ. 529/70

කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන සමූහාණ්ඩුව වෙනුවෙන් සුවිශේෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනී සිටීමට පත් කරනු ලැබූ හ්වාන්ග් යොන්ග් වූ උතුමාණන්ගේ අක්ත පත්‍රය, මහා රාජිනීන් වහන්සේ වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
කොළඹ,
1970 සැප්තැම්බර් 5.
9–527

526ඒ

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

සැ.යු.—14,921/1 කාණ්ඩයේ අවසාන අති විශෙෂ ගැසට් අංකය 14,921/6 ය..

668/1——ජේ 16575—5,525 (70/9)